**ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.1 හා 3.1.2 වගුවල ඇතුළත් අදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම් 04 ක්ද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය ප්‍රගතිය හා ප්‍රධාන කාර්යයන්වල කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 21 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 307 වැය ශීර්ෂය පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.17 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මුල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන් දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 විධිවිධාන - ගණන් දීමේ නිලධාරීන්ගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මුල්‍ය ප්‍රතිපාදන සලසා දී මෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි.<br>2. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.1.2<br>2.13 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.8 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම | 2.13 |
| | | 2. අනුකූල නොවීම | 2.14 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු | 2.10 |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.11 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වු හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 1. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.2 |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට යවන බව | 1. ආදායම් ගිණුම් සම්බන්ධව | 2.10(අ) |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් | 2.11 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව, | 1. ආදායම් ගිණුම්වල වූ අඩුපාඩු | 2.10(අ) |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.11 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඵ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව<br>(මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තුමත වියදම් දැරීම නොව, වියදම් කරනු ලබන මුදල දරනා රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරිම) | 1. මතභේදයට තුඩුදෙන ගනුදෙනු | 2.4 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳි සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව (මු.රෙ.150 බලන්න) | 1. විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9(අ) |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව<br>(වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | 1. මූල්‍ය අක්‍රමිකතා ස්වභාවයේ ගනුදෙනු | 2.5 |

## 2 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 2.1 කාර්යසාධනය

---------------

### 2.1.1 දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර

--------------------------------------

2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, ක්‍රියාකාරී සැලැස්ම, මෙහෙවර ප්‍රකාශනය සහ ප්‍රධාන කාර්යභාරයන් අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) වාහන ලියාපදිංචිය, හිමිකම පැවරීම හා රියදුරු බලපත්‍ර නිකුත් කිරීම**

--------------------------------------------------------------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වන මෝටර් වාහන ලියාපදිංචිය, වාහන හිමිකම් පැවරීම හා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| කාර්යය | ප්‍රමාණය | | වැඩිවීම/ (අඩුවීම) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | **2017** | **2016** | | |
| මෝටර් වාහන ලියාපදිංචිය | 451,653 | 493,328 | (41,675) | (8.45) |
| වාහන හිමිකම පැවරීම | 708,211 | 491,788 | 216,423 | 44 |
| නව රියදුරු බලපත්‍ර නිකුත් කිරීම | 369,033 | 358,560 | 10,473 | 2.92 |

**(ආ) කාර්මික සේවාවන් සැපයීම**

-------------------------------

පරිගණක ආශ්‍රයෙන් රියදුරු බලපත්‍ර සඳහා ලිඛිත පරීක්ෂණ පැවැත්වීම සමාලෝචිත වර්ෂයේ සිදුකර නොතිබුණි. 2018 වර්ෂයේදී වේරහැර කාර්යාලයේ පමණක් ආරම්භ කර තිබුණු අතර ප්‍රාදේශීය කාර්යාල 24 ක ක්‍රියාත්මක කර නොතිබුණි. රියදුරු පාසල් සුපරීක්ෂණය කිරීමද සතුටුදායක මට්ටමක නොතිබුණි.

**(ඇ) වායු විමෝචන තත්ත්වය නියාමනය**

----------------------------------------

**(i)** වායු දූෂණය සිදුවී ඇති ක්ෂේත්‍ර හා ප්‍රදේශ හඳුනාගැනීමට ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණද මහජනතාවට ඇති සෞඛ්‍ය අවදානම අඩුකිරීමට ප්‍රමාණවත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**(ii)** 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සිදුකර තිබූ වායු විමෝචන පරීක්ෂණ 31,329,486 කින් 5,802,365 ක් හෙවත් සියයට 19 ක් දුම් පරීක්ෂණ පලමු අවස්ථාවේදී අසමත් වී තිබුණි. 2008 හා 2017 වර්ෂවල සිදුකල වායු විමෝචන පරීක්ෂණවලින් අසමත් වීමේ ප්‍රතිශතය සියයට 13 සිට 26 දක්වා වූ පරාසයක විය.

**(iii)** දුම් පරීක්ෂණ ආයතනය මඟින් කරනු ලබන පරීක්ෂණ දත්ත, තොරතුරු හා සන්නිවේදන තොරතුරු තාක්ෂණ ආයතනයේ (ICTA) දත්ත ගබඩාවෙහි ගබඩා කර පැවතිය ද එම තොරතුරු උපයෝගී කරගෙන ප්‍රධාන නගරවලට ඇතුලු වන වාහනවලින් සිදු වන වායු දූෂණ බලපෑම අවම කිරීම, ආනයනය කල යුතු වාහන වර්ග හා පන්ති පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය නිර්දේශ කිරීම, වාහන භාවිතා කල හැකි උපරිම කාලය නිර්ණය කිරීම වැනි විශ්ලේෂණ කාර්යයන් සඳහා යොදා ගෙන තිබූ බවට නිරීක්ෂණය නොවීය.

### 2.1.2 සැලැසුම් කිරීම

-----------------

දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 11 ක් හඳුනාගෙන තිබූ අතර, දෙපාර්තමේන්තුව සහ ඒ යටතේ ස්ථාපිත කර ඇති අරමුදල් 02 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** සැලැස්මේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් නියෝජනය වී නොතිබුණු අතර, එක් එක් ආදායම් සංකේතයන් සඳහා ආදායම් එකතු කිරීමේ කටයුතු පිළිබඳ සැලසුම් ඇතුලත් කර නොතිබුණි.

**(ආ)** ඇයවැය ඇස්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 1230.8 ක් වෙන් කර තිබුණද ක්‍රියාකාරී සැලැස්මේ රු.මිලියන 343 ක් වටිනා ක්‍රියාකාරකම් පමණක් දක්වා තිබුණි.

### 2.1.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

------------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයන් 06 ක් ඉටු කළ යුතුව තිබුණත්, ඉන් කාර්යභාරයන් 02 ක් ඉටු කර නොතිබුණි. එසේ ඉටු නොකළ එක් ප්‍රධාන කාර්යයක් වන ඊ මෝටරින් ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 135 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ දිනය | කළනිම කළ යුතුනිම දිනය | දිනය | කළ2017 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | | | | රු.මිලියන | |
| ඊ-මෝටරින් ව්‍යාපෘතිය | 5000 | 2016.08.31 (ප්‍රසම්පාදන ක්‍රියාවලිය) | - | - | 0.28 | විධිමත් පියවර නොගැනීම |
| ලේඛනාගාරය ඉදිකිරීම | 87 | 2016.03.26 | 2016.11.30 | 2017.11.30 | 98 | -එම- |
| ලේඛනාගාරයේ රාක්ක සවි කිරීම | 127 | 2017.01.12 | 2017.04.12 | 2018.03.27 | 85 | -එම- |
| රියදුරු පරීක්ෂණ ධාවන පථය හා රථගාල ඉදි කිරීම | 93 | 2015.07.15 | 2015.07.15 | අවසන් නැත. | කරතොරතුරු සපයා නැත. | -එම- |

**2.2** **ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයුම් හා සේවා ලබාගැනීම.**

**ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගැනීමට වූ රු. මිලියන 2,580.98 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 2,557.45 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

**2.3** **වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ)** **වාහන උපයෝජනය**

**ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සෑම මාස 06 කට වරක් ඉන්ධන දහනය වීම පරීක්ෂා කල යුතු වුවත් වාහන 16 ක එසේ සිදු කර නොතිබුණි.

**(ආ)** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පැරණි ලේඛනාගාර ගොඩනැගිල්ලෙහි පැත්තක් ඇලවීම නිසා 2012 සිට එය භාවිතයෙන් ඉවත් කර තිබුණි. මෙම ගොඩනැගිල්ල යලි පිළිසකර කර ප්‍රයෝජනයට ගැනීමට හෝ කඩා ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් වේරහැර අක්කර 10.995 ක ඉඩම හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් විධිමත් පවරා ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට යොදා ගනිමින් තිබුණි.

## 2.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2016 දෙසැම්බර් නිකුත් කරන ලද රු.2,017,660 හා රු.22,784,104 වටිනා චෙක්පත් 02 ක් 2017 නොවැම්බර් මස දක්වාම බැංකුවට ගෙවීමට ඉදිරිපත් වී නොතිබුණි. වටිනාකම රු.22,784,104 ක් වූ චෙක්පත අවලංගු කර චෙක්පත් 02 ක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් නමට හා අදාල ආදායකයාගේ නමින් නිකුත් කර තිබුණි. ආදායකයාගේ චෙක්පත් 02 ක 2017 දෙසැම්බර් මාසයේ දී ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් වී තිබුණි. චෙක්පත් ලියා වර්ෂයකට ආසන්න කාලයක් ලඟ තබා ගැනීම මතභේදයට තුඩු දී තිබුණි.

## 2.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ)** වාහන ලියාපදිංචි කිරීමට 2002 වර්ෂයේ ඉලක්කම් වෙනුවට ඉංග්‍රීසි අක්ෂර සහිත අංක ලබා දී තිබුණි. එම අවස්ථාවේ අංක 302 කාණ්ඩයට ඇතුලත් අංක 45 ක් සඳහා වාහන ලියාපදිංචි නොකර පරිගනක පද්ධතිය තුල පැවතීමට ඉඩහැර තිබුණි. 2013 වර්ෂයේ මේ පිළිබඳ දැනුවත් කලද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. පසුව එම අංක 10 ක් සඳහා වාහන ලියාපදිංචි කර තිබුණු අතර එම වාහන නිත්‍යානුකූලව ආනයනය කල වාහනද නීති විරෝධි ලෙස ආනයනය කල වාහන ද නැතහොත් ශ්‍රී ලංකාව තුල එකලස් කල වාහන ද යන්න දෙපාර්තමේන්තුව විසින් හෝ රේගුව විසින් හඳුනාගෙන නොතිබුණි. වාහන ලිපිගොනු 10 ක් විගණනයට ඉදිරිපත් නොවුණු අතර ඉන් වාහන 02 ක් අර්ධ සුඛෝපභෝගී බදු අය කල යුතු වාහන විය. එම වාහන 02 ක සඳහා වර්ෂ 07 ක් වෙනුවෙන් රු. 367, 500 ක් සුඛෝපභෝගී බදු අය විය යුතු විය.

**(i)** එම වාහන අංක 10 ට අදාලව වාර්ෂිකව ලබාගත යුතු අදායම් බලපත්‍රය නිකුත් කර තිබෙන ආකාරය පරික්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

| වාහන අංකය | ආදායම් බලපත්‍ර ලබාගත් දිනය | ආදායම් බලපත්‍ර ලබාගත් කාලසීමාව |
|---|---|---|
| 302 – 2071 | 2017.03.13 | 2000 – 2017 |
| 302 – 2022 | 2016.09.07 | |
| 302 – 0637 | 2013.06.06 | 2012 – 2017 |
| 302 – 2023 | 2015.05.12 | |
| 302 – 2024 | 2012.01.30 | |
| 302 – 2026 | 2015.10.23 | |
| 302 – 2027 | 2014.02.05 | |
| 302 – 2033 | | ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

302 – 0514 2017.05.04 2008 – 2018

**(ii)** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ක්‍රියාපටිපාටිය අනුව වාහනයක අයිතිය පැවරීමේදී එම වාහනයේ පැවරුම් දිනට අදාල ආදායම් බලපත්‍රය ඉදිරිපත් කල යුතු වුවත් එසේ සිදුකර නොතිබියදී අයිතිය පවරා තිබුණි. අයිතිය පැවරීම 2015 නොවැම්බර් 04 දින සිදු කලද 2000 සිට 2017 දක්වා ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණේ 2016 සැප්තැම්බර් 07 දිනදීය.

**(ආ)** ශ්‍රී ලංකා රේගුව විසින් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණු වැරදි වෙසි අංක සඳහා ව්‍යාජ රේගු සටහන්කර උපයෝගී කරගෙන 2016 හා 2017 වර්ෂවලදි වාහන 07 ක් ලියාපදිංචි කර තිබුණි. වාහන ලිපිගොනු 07 න් 05ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර ඉදිරිපත් කල වාහන ලිපිගොනු 02 අනුව ලියාපදිංචිය සඳහා ව්‍යාජ රේගු සටහන්කර උපයෝගී කරගෙන තිබුණි. මෙම වාහන 2008, 2010 හා 2011 වර්ෂවල ආනයනය කර තිබුණද දෙපාර්තමේන්තුව විසින් 2012, 2013 හා 2014 ලෙස වෙනස් කර තිබුණි. මේ නිසා රජයට රු මිලියන 13.5 කට ආසන්න බදු මුදලක් අහිමි වී තිබුණි. මෙම තත්වයට දෙපාර්තමේන්තු පරිගනක පද්ධතියේ පවතින දුර්වලතා හේතු වී තිබුණි.

**(ඇ)** G,H,J, යන අක්ෂර කාණ්ඩ යටතේ ලියාපදිංචි කරන ලද යතුරුපැදි අංකවලට, ත්‍රාඩෝ රථවලට අදාළ තොරතුරු පරිගණක පද්ධතියට ඇතුළත් කර ව්‍යාජ ලෙස වාහන ලියාපදිංචි කළ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය. එම තොරතුරු සැසඳීම සඳහා G,H,J අක්ෂර හා අංක 65, 300, 254, 63, 61, 62, 32 යන කාණ්ඩවලට අදාළ ලියාපදිංචි වාහනවල තොරතුරු විගණනයෙන් කැඳවා තිබුණ ද මේ වන තෙක් එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**2.6 විසඳා නොතිබුණු විගණන ඡේද**

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | **වර්ෂය** | **ඡේද අංකය** | |
| (අ) | 2014 | 5.13 (අ) | අවිධිමත් ලෙස වාහනවල සිදුකරනු ලබන පරිවර්තන සම්බන්ධයෙන් කටයුතු කිරීම හා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) | 2016 | 3.9 (ඇ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගනක පද්ධතිය සම්බන්ධ රේගු දෙපාර්තමේන්තුවේ තොරතුරු සම්බන්ධතාවය මඟින් මෝටර් රථ නව ලියාපදිංචියට අදාල දත්ත ඍජු ලෙස පරීක්ෂා කර ගත හැකි ආකාරයට පරිගනක පද්ධතිය සකස් කිරීමට කටයුතු නොකිරීම. |

## 2.7 කළමනාකරණ දුර්වලතා

---

### 2.7.1 රියදුරු බලපත්‍ර නිකුත් කිරීම

---

2009 මාර්තු 27 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ස්මාට් කාඩ් රියදුරු බලපත්‍ර 4,677,585 ක් මුද්‍රණය කිරීමට රු.මිලියන 7467 ක් ගෙවීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2009 වර්ෂයේ දී අදාල සැපයුම්කරු සමඟ එළැඹී කොන්ත්‍රාත් ගිවිසුම අනුව එහි වර්ෂ 07 ක ගිවිසුම් කාලය 2016 මාර්තු 26 දින අවසන් වී තිබුණි. ඒ අනුව රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාලව කොන්ත්‍රාත්කරු සතු සියලු වත්කම් සහ රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන එම පවරා ගත් දින සිට මෙම කටයුතු සියල්ල දෙපාර්තමේන්තුව විසින් කරගෙන යා යුතුය. නමුත් මේ දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුම ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම BOT පදනම මත සිදු කරනු ලබන හෙයින් රියදුරු බලපත්‍රයක මිල තීරණය වීමේ දී, ඉදිකිරීම් (Build), ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම (Operate), පැවරීම (Transfer) සඳහා යන වියදම් ද ඒ තුල අඩංගු වේ. පැවරීම (Transfer) සිදු නොකිරීම නිසා මේ දක්වා කොන්ත්‍රාත්කරුට ගෙවන ලද මුදලේ අඩංගු ඉහත වියදම් නිශ්කාර්යය වියදමක් බවට පත් වී තිබුණි. තවද 2016 අප්‍රේල් 01 දින සිට දෙපාර්තමේන්තුවට අයිති විය යුතු ඉහත වත්කම් පාවිච්චි කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් කිසිදු මුදලක් දෙපාර්තමේන්තුවට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රියදුරු බලපත්‍ර කළමනාකරණ පද්ධතිය (Driving License Management System) ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය දෙපාර්තමේන්තුවේ නිලධාරින් අධීක්ෂණය කර නොතිබුණි.

(ඈ) කොන්ත්‍රාත් ගිවිසුමෙහි 3.4.20 වගන්තියට අනුව දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශයේ නිලධාරීන්ට කළමනාකරණ පද්ධතිය පිළිබඳව හා එම පද්ධතිය ක්‍රියාත්මක කරගෙනයාමේ දී මතුවන ගැටළු නිරාකරණය කිරීම (Trouble Shooting) මෙන්ම පද්ධතිය නඩත්තුව (System Maintenance) පිළිබඳ ගැඹුරු පුහුණුවක් ලබාදීමට එකඟ වී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් ද අදාල පුහුණුව නිලධාරීන්ට ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) ගිවිසුම ප්‍රකාරව 1989 ට පෙර ලබා දී ඇති පැරණි රියදුරු බලපත්‍ර නව රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ පරිගණක පද්ධතියට ඇතුලත් කර නොතිබුණි. මේ හේතුව නිසා ව්‍යාජ සහතික ඉදිරිපත් කර ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවලට ඉදිරිපත් නොවී නව ස්මාර්ට් රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ඉඩකඩ පවතින බව ද නිරීක්ෂණය විය.

(ඊ) රියදුරු බලපත්‍රවල ප්‍රමිතිය පරීක්ෂා කිරීමට ගිවිසුම්ගත වී තිබුණ ද එය සිදු කර නොතිබූ අතර දෙපාර්තමේන්තුව විසින්ද එය සිදුකර නොතිබුණි.

(උ) ස්මාට් කාඩ් රියදුරු බලපත්‍ර මුද්‍රණය දෙපාර්තමේන්තුව ආරම්භ කල 2009 වසර හා සසඳන විට වර්තමානයේ විෂය පථය සරල වීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය අඩු විය යුතු අතර මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් කාරක සභාවට ඉදිරිපත් කල වාර්තාවට අනුවද එය රු.300 ක මුදලකට සිදු කල හැකි බව පෙන්වා දී තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව කාලීනව ගිවිසුම් අලුත් කිරීමක් සිදු නොකර 2009 ගිවිසුම් ගත වූ රු.1340 ක මුදලටම කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණි. කාලීනව මිල ගණන් කැඳවීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ඌ)** නව තාක්ෂණය අනුව සකසා ඇති ස්මාට් කාඩ්පත්‍රය කියවීමට අවශ්‍ය යන්ත්‍ර නීතිය ක්‍රියාත්මක කරන අංශවලට ලබා දී නොමැති වීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

**2.7.2 වාහන අංක තහඩු සැපයීම.**
**--------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

**(අ)** වාහන අංක තහඩු සැපයීමේ කොන්ත්‍රාත්තුව 2015 අප්‍රේල් 29 දින අවසන් වී තිබූ අතර ප්‍රසම්පාදන කටයුතු නියමිත දිනවල සිදු නොකිරීම හා සිදුකල ප්‍රසම්පාදන අවලංගු කිරීම නිසා 2015 කොන්ත්‍රාත්තුව ලබාදුන් ආයතනයටම 2018 මාර්තු 31 දින දක්වා අවස්ථා 05 කදී දීර්ඝ කර තිබුණි. 2016 නොවැම්බර් 16 දින මිල ගණන් කැඳවූ අවස්ථාවේ එම ආයතනය වර්තමාන මිලට වඩා සියයට 23 ක් අඩුවෙන් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙය පදනම් කරගෙන කාලය දීර්ඝ කිරීමේ දී එකඟතාවයට එළඹීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ආ)** 2,000,000 ක් පමණ වන ඉංග්‍රීසි අකුරු නොමැති වාහන සඳහා අංක තහඩු නිකුත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**2.7.3 සුඛෝපභෝගී බදු අය කිරීමේ රිසිට් පොත් අස්ථානගත වීම.**
**-----------------------------------------------------------**

රක්ෂණ ආයතන 03 ක් වෙත සුඛෝපභෝගී වාහන බදු අය කිරීමට නිකුත් කල රිසිට් පත් අස්ථානගත වී තිබූ අතර රක්ෂණ ආයතනවලින් ඒ සම්බන්ධ අදාල මුදල් අයකර ගැනීමට 2018 ඔක්තෝබර් දක්වා කටයුතු කර නොතිබුණි.

**2.8 මහජනයා වෙත සේවා ඉටු කිරිම.**
**---------------------------------**

දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් මහජනයාට අවශ්‍ය දැනුවත් කිරීම් හා මහජනයාගෙන් පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.9 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**
**---------------------------------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විසර්ජන ගිණුම**
**---------------**

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම.**
**-------------------------------------------------**

වැය විෂයන් 01ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 50 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය නොකර මුළුමනින්ම ඉතිරිව තිබුණි. වැය විෂයන් 18 කට අදාලව එකතුව රු. මිලියන 352 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් රු. මිලියන 149 ක ප්‍රතිපාදන ඉතිරිවීම් වාර්තා වී තිබුණු අතර එය එම වැය විෂයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 07 ක සිට 88 දක්වා පරාසයක් තුළ විය.

**(ii)** **අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයන් 02 කට වෙන් කල ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයකට මාරු කිරීමෙන් පසුවද සියයට 65 ක් හා සියයට 88 ක් ඉතිරි වී තිබුණි. මේ අනුව අධි ප්‍රතිපාදනය සලසා ඇති බව නිරීක්ෂණය විය.

## 2.10 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 04 ක් සඳහා එකතුව රු.මිලියන 11,470 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 10,661 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 93 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2017 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | රැස්කළ ආදායම ඇස්තමේන්තු කළ අදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10-03-01-00 | 1,500 | 1,287 | (213) | (85.8) |
| 20-03-02-14 | 9,000 | 9,172 | 172 | 101.9 |
| 10-03-07-04 | 70 | 69 | (1) | (98.5) |
| 20-03-02-15 | 900 | 133 | (767) | (14.7) |
| එකතුව | 11,470 | 10,661 | (809) | (98) |

ඉහත සඳහන් අදායම් ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) 10-03-01-00** **දරන ආදායම් සංකේතය - සුඛෝපභෝගී මෝටර් වාහන බදු ආදායම**

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(i)** දෙපාර්තමේන්තුව විසින් 1995 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා හිඟ ආදායම් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. මේ නිසා එම කාලයට අදාල හිඟ ආදායම කොපමණද යන්න තහවුරු කල නොහැකි විය.

**(ii)** විගණනයට ඉදිරිපත් කල ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 220 ක ආදායම් හිඟ හිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට 08 අතර කාල පරාසයකට

අදාල විය. එම හිඟ හිටි අදායම් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(iii)** ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සුඛෝපභෝගී මෝටර් වාහන, අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන සහ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්යය වාහන ලියාපදිංචිය පිළිවෙළින් සියයට 47, 44 සහ 13 කින් අඩු වී තිබුණි.

**(ආ) 10-03-07-04 දරන ආදායම් සංකේතය - මෝටර් වාහන විකිණීම මත බදු ආදායම්**

වාහනවල මුල් ලියාපදිංචි අයිතිකරු විසින් එම වාහනයේ සන්තකය වෙනස් වීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දැනුවත් කරන අවස්ථාවේ දී පමණක් මෙම ගාස්තුව අයකරගත හැකි වුවද එසේ දැනුවත් නොකර අයිතිය හුවමාරු වන අවස්ථාවලදී අයවිය යුතු බදු මුදල් හඳුනාගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව හඳුන්වා දී නොතිබුණි.

**(ඇ) 20-03-02-15 දරන ආදායම් සංකේතය - මෝටර් වාහන පැවරීමේදී වාහන ආනයන බලපත්‍ර යටතේ අයකරනු ලබන ගාස්තු ආදායම්**

මූලික ඇස්තමේන්තුව අනුව සමාලෝචිත වර්ෂයේ දී මෙම ආදායම් ශීර්ෂය යටතේ අපේක්ෂිත ආදායම රු.මිලියන 900 ක් වූ අතර තත්‍ය වශයෙන් උපයා ඇති ආදායම රු.මිලියන 133 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමට වඩා තත්‍ය ආදායම සියයට 85 කින් අඩු වී තිබුණි.

## 2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 30701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 31.00 | 30.90 | 22 | 22.68 | 155 | 116 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 3,282,754 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 28 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

## 2.12 පොදු තැන්පත් ගිණුම

---

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 06 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 332 ක් විය. වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. මිලියන 21 ක්වූ තැන්පතු 32 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.13 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය. | යාවත්කාලීන කර නොතිබුණි. තවද දෙපාර්තමේන්තුව මිලදීගත් බහාලුම් 17 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2.14 අනුකූල නොවීම්

-----------------

### 2.14.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 1646 | සියලුම වාහන වල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඉදිරිපත් කරනු ලබන මාසයට පසු මාසයේ 15 වන දිනට ඉදිරිපත් කල යුතු වුවත් වාහන 05 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ 2012 වර්ෂයේ සිට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන **රාජ්‍ය** මුදල් චක්‍රලේඛයේ 3 හා 4 ඡේද. | 2004 ජනවාරි 01 දිනෙන් පසුව මිලදී ගත් වත්කම් සම්බන්ධයෙන් විස්තර ඇතුළත් වාර්තාවක් අර්ධ වාර්ෂිකව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | 2013 ජූලි 12 දිනැති අංක එස්ජ්/ඒඑස්/ඒජ් දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | නියමිත පරිදි ආයතනය සතු ඉඩම්, ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් තක්සේරු කිරීමේ කාර්යය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදු කර නොතිබුණි. |
| **(ඈ)** | **වෙනත් චක්‍රලේඛ හා ගැසට් නිවේදන** | |
| **(i)** | 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අඩංගු 2015 අංක 01 දරන මෝටර් වාහන නියෝග අංක 01 | සෑම රියදුරු පාසලක්ම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල යුතු වුවත්, පරීක්ෂා කල රියදුරු පාසල් 21 කින්, රියදුරු පාසල් 06 ක් ලියාපදිංචි කර නොතිබුණි. |
| **(ii)** | 2016 ජුනි 08 දිනැති අංක 02/2016 (i) දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ පවතින රේගු තොරතුරු හා අයදුම්පතෙහි පවතින තොරතුරු අතර සැසඳීමක් නොකර යතුරු පැදි ලියාපදිංචි කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |

## 2.15 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන ප්‍රමිත සහ ආචාරධර්ම 1230 ට අනුව අභ්‍යන්තර විගණකයින් අඛණ්ඩ ව සිය වෘත්තීය සංවර්ධනය තුළින් දැනුම, දක්ෂතාව හා අනෙකුත් කුසලතා වැඩිදියුණු කර ගත යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ මේ සඳහා ක්‍රමවත් වැඩසටහනක් හඳුන්වා දී නොතිබුණි.

## 2.16 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. 427,576,870 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 483,684ක් වී තිබුණි.

| | සේවක වර්ගය --- | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 29 | - |
| (ii) | තෘතියික මට්ටම | 23 | 06 | 17 |
| (iii) | ද්විතියික මට්ටම | 796 | 729 | 67 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 128 | 120 | 08 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | - | - | - |
| | එකතුව | 976 | 884 | 92 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2012 දෙසැම්බර් 30 දිනැති අංක 05/2012 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු නිලධාරීන් එක් සේවා ස්ථානයක වර්ෂ 05 ක් සේවය කල පසු අනිවාර්යයෙන්ම වෙනත් සේවා ස්ථානයකට මාරු කල යුතු වුවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 63 දෙනෙකු එකම ස්ථානයේ වර්ෂ 10 කට වැඩි කාලයක් සේවය කරමින් පවතින බව නිරීක්ෂණය විය.

**(ආ)** තෘතීය මට්ටමේ නිලධාරී පුරප්පාඩු 17 ක්, ද්විතීයික මට්ටමින් නිලධාරී පුරප්පාඩු 67ක් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරී පුරප්පාඩු 08 ක් පැවතිය ද ඒවා සම්පූර්ණ කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

**(ඇ)** කාර්මික සේවා අංශයට එක් සහකාර කොමසාරිස්වරයෙකු පමණක් පත්කර තිබූ අතර එම අංශයේ පවතින කාර්යභාරයට අනුව එය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

## 2.17 තිරසාර සංවර්ධන අරමුණු වලට අනුගත වීම.

2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11.2 සහ 11.6 යන අරමුණු ලඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙය විය යුතු වන නමුත් මේ දක්වා දෙපාර්තමේන්තුව විසින් එකී අරමුණු මොනවාද යන්න හඳුනාගෙන ඒවා ඉටුකර ගැනීමට අදාල වැඩසටහන් සකස්කර නොතිබුණි.